මගේ අංකය : ඩී2/ප්‍ර.ජේ./පත්වීම්/V
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09
2026.09.11

මූලස්ථාන අධිකාරි, සියළුම බන්ධනාගාර අධිකාරින් සහ
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත,

**<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ජේලර් (පිරිමි) තනතුරට උසස් කිරිම - 2026</u>**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ජේලර් (පිරිමි) තනතුරේ පුරප්පාඩු පිරවීම පිණිස අයදුම්පත් කැඳවන අවසාන දිනය වන **2026** සැප්තැම්බර් **30** දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති දැනට බන්ධනාගාර සේවයේ නියුතු I පෙළ ජේලර් නිලධාරින්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පිරවීමට අපේක්ෂා කරන ප්‍රධාන ජේලර් (පිරිමි) තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාව 20කි.

**03. මාසික වැටුප් පරිමාණය :**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි RS – 5/2025 වැටුප් බණ්ඩය අදාළ වේ. එම වැටුප් බණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වෙ.

රු. 72,800-17x1400 – 96,600/= (මාසික)

(2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු. 72,800/- ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ)

**04. සපුරාලිය යුතු සුදුසුකම් :**

I. අයදුම්පත් කැඳවන අවසාන දිනය වන 2026.09.30 දිනට I පෙළ ජේලර් තනතුරේ වසර (05)ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**05. උසස් කිරිමේ ක්‍රමය:**

- අයදුම්පත් කැඳවීමෙන් පසු සුදුසුකම් සම්පූර්ණ කරන I පෙළ ජේලර් නිලධාරින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු අනුව ප්‍රධාන ජේලර් තනතුරට උසස් කරනු ලැබේ. එකී සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පුරප්පාඩු සඳහා උසස් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය මේ සමඟ අමුණා ඇත. තවද සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පත්වීමක් ලැබීමට සුදුසුකමක් නොවේ.

**06. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය :**

- ඉහත දක්වා ඇති සියළු සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරින් සම්බන්ධව මෙම නිවේදනය සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ඔබගේ නිර්දේශය සහිතව (නම සහිත නිල මුද්‍රාව තබා නිර්දේශ කල යුතු වේ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන **2026** සැප්තැම්බර් **30** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අංක 150, බේස්ලයින් පාර, කොළඹ 09 පිහිටි බන්ධනාගාර මූලස්ථානයේ ආයතන ශාඛාව වෙත එවිය යුතුය.

- නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන අයදුම්පත්, නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, නිවැරදි තොරතුරු ඇතුළත් නොකරන ලද අයදුම්පත් සහ නියමිත දිනයට පසුව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- නිලධාරියාගේ පුද්ගලික ලිපි ගොනු අංකය නිවැරදිව අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය.

07. අදාල අයදුම්පත්‍රයේ **බන්ධනාගාර අධිකාරිගේ නිර්දේශය** යටතේ සඳහන් තොරතුරු වගකීමකින් යුතුව ඔබ විසින් සම්පූර්ණ කර අදාළ **නිර්දේශයන්** සඳහන් කර මා වෙත එවීමට කටයුතු කරන්න. යම් හෙයකින් එම තොරතුරු නිරවද්‍ය නොවුණහොත්, ඔබ සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව ද දන්වා සිටිමි.

08. එසේම ඔබ ආයතනය මඟින් අයදුම්පත් යොමු කරන ලද නිලධාරින්ගෙන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ පුද්ගලික ලිපි ගොනු සම්මුඛ පරීක්ෂණය සඳහා බන්ධනාගාර මූලස්ථානය වෙත ගෙන්වා ගත යුතු බැවින්, ඔබ ආයතනයේ අයදුම්පත් යොමු කරන සියළු නිලධාරින්ගෙන් පුද්ගලික ලිපි ගොනු යාවත්කාලින කර තබා ගන්නා ලෙස මින් දන්වා සිටිමි.

**ආර්.ප්‍රසාද් හේමන්ත කුමාර**
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ.)

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ජේලර් (පිරිමි) තනතුරට උසස් කිරීම**
**සඳහා අයදුම් පත්‍රය - 2026**

01. අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :-........................................................................................

මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :-........................................................................................

අයදුම්කරුගේ සම්පූර්ණ නම :-........................................................................................

සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :-........................................................................................

02. උපන්දිනය :-.........................................................................

අයදුම්පත් කැඳවීමේ අවසන් දින (2026.09.30 දිනට) වයස:- අවුරුදු:-.............. මාස:-............. දින:-.........

03. ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

04.ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐

05. ස්ථිර ලිපිනය :-........................................................................................

06. කාර්යාලීය ලිපිනය :-........................................................................................

07. දුරකථන අංකය :- | | | | | | | | | | |

08. I පෙළ ජේලර් තනතුරට පත් වූ දිනය :-........................................................................................

I පෙළ ජේලර් තනතුරෙහි සේවා කාලය (2026.09.30) :-........................................................................................

09. වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර:-........................................................................................
........................................................................................

10. ලබා ගෙන ඇති අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර :-........................................................................................
........................................................................................

11. ඔබට විරුද්ධව මේ වන විට මූලික විමර්ශනයක්, විනය පරීක්ෂණයක් ආරම්භ කර තිබේද? ඔව් / නැත
(ඔව් නම් විස්තර සඳහන් කරන්න) :- ........................................................................................
........................................................................................

චෝදනා පත්‍රයක් නිකුත් කර තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න:- ........................................................................................
........................................................................................

12.2026.09.30 දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා තිබේද? :-

.........................................................................................................................................................

13.දැනට දරණ තනතුරට පත් වීමෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨත්වයෙන් පහත හෙලා ඇත්නම් ඒ පිළිබඳ විස්තර (ජ්‍යෙෂ්ඨත්වය පහත හෙලිමට හේතු හා ඒ ඒ හේතූන් මත පහත හෙලා ඇති ජ්‍යෙෂ්ඨත්ව කාල සීමාව පැහැදිලිව සඳහන් කළ යුතු වේ):-

.........................................................................................................................................................

14. නියමිත වැටුප් වර්ධක උපයා ගැනිම සහ කුසලතාවය පිළිබඳ විස්තර :- (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

| වර්ෂය | වැටුප් වර්ධක උපයා ගැනිම | | කාර්ය සාධන කුසලතාවය | | | නිවැරදි බවට වි.ලි./ප්‍ර.ලි. සටහන |
|---|---|---|---|---|---|---|
| | ඇත | නැත | විශිෂ්ඨ | සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ | සතුටුදායක | |
| 2021 | | | | | | |
| 2022 | | | | | | |
| 2023 | | | | | | |
| 2024 | | | | | | |
| 2025 | | | | | | |
| 2026 | | | | | | |

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සඳහන් කර ඇති තොරතුරු කිසිවක් වැරදි හෝ අසත්‍ය බව මා උසස් කරනු ලැබීමට පෙර සනාථ වුවහොත් මගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බව හා උසස් කරනු ලැබීමෙන් පසුව හෙළිවුවහොත් මාගේ පත්වීම අවලංගු වන බවත් මම දනිමි.

දිනය:- ..............................

......................................................

අයදුම්කරුගේ අත්සන

**බන්ධනාගාර අධිකාරිගේ නිර්දේශය**

01) ඉහත අංක 01 සිට 14 දක්වා නිලධාරියා විසින් සඳහන් කර ඇති කරුණු වල නිවැරදිතාවය පහත පරිදි තහවුරු කරන්න. (නිවැරදි නොවන්නේ නම් ඉදිරියෙන් නිවැරදි තොරතුරු ඇතුළත් කරන්න)

- 01 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 02 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 03 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 04 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 05 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 06 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 07 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 08 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 09 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 10 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 11 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 12 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 13 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................
- 14 කරුණ - නිවැරදියි / වැරදියි ........................................................................................................

බන්ධනාගාර I පෙළ ජේලර් ............................................ **නිලධාරියා** මෙම ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ පෙරාතුව, ඔහු සම්බන්ධව විසඳීමට විනය පරීක්ෂණ **ඇති /**නැති බවත්, (විනය පරීක්ෂණ ඇත්නම් ඒ පිළිබඳ විස්තර සැපයිය යුතුය.) නියමිත වැටුප් වර්ධක උපයාගෙන **ඇති/**නැති බවත්, එම කාලය තුළ නිලධාරියාගේ වැඩ ,හැසිරීම හා පැමිණීම **සතුටුදායක /**අසතුටුදායක බවත් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා **තිබෙන/**නොතිබෙන බවත්, ප්‍රධාන ජේලර් තනතුරට උසස් කිරීමට සෑම සුදුසුකමක්ම ඔහු විසින් ලබා ගෙන ඇති **/**නැති බවත්, සහතික කර උසස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

**(අනවශ්‍ය වචන කපා හැරීම අනිවාර්ය වේ)**

දිනය :- ............................................... ........................................................

බන්ධනාගාර අධිකාරී
(නිල මුද්‍රාව තබන්න)

ප්‍රධාන ජේලර් (පිරිමි) තනතුර සඳහා යොෂ්‍යතාවය හා කුසලතාවය මත උසස් කිරීම
අනුමත ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රධාන ජේලර් තනතුර සඳහා යොෂ්‍යතාවය හා කුසලතාවය මත උසස් කිරීම -අනුමත ලකුණු දීමේ පටිපාටිය | උපරිම ලකුණු | මුළු ලකුණු |
|---|---|---|
| **01. යොෂ්‍යතාවය සඳහා:**<br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 01/2019 හි සඳහන් විධිවිධාන පරිදි සම්මුඛ පරීක්ෂණයේ දී යොෂ්‍යතාවය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ | 60 | 60 |
| **02.කුසලතාවය සඳහා :**<br>**2.1** වර්තමාන තනතුරට පත් වූ පසු ලබා ඇති ප්‍රශංසා සඳහා<br>I. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දෙනු ලබන ප්‍රශංසාවකට ලකුණු 02ක බැගින්<br>II. බන්ධනාගාර අධිකාරි විසින් දෙනු ලබන ප්‍රශංසාවකට ලකුණු 01ක බැගින්<br>(පොදු 230b ආකෘතිපත්‍රය අනුව ප්‍රශංසා ලබා තිබිය යුතුය)<br>**2.2** අධ්‍යාපන සුදුසුකම් සඳහා<br>I. රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පශ්චාත් උපාධිය හෝ ඉහල සුදුසුකමක් සඳහා - ලකුණු 10<br>II. රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධිය හෝ ඉහල සුදුසුකමක් සඳහා - ලකුණු 08<br>III. උසස් ඩිප්ලෝමා සඳහා (අවුරුදු 02ක් හෝ ඊට වැඩි/ පැය 3000ක් හෝ ඊට වැඩි) - ලකුණු 04<br>IV. ඩිප්ලෝමා පාඨමාලා (අවුරුදු 01ක් හෝ ඊට වැඩි/ පැය 1500ක් හෝ ඊට වැඩි) - ලකුණු 03<br>V. සහතික පත්‍ර (මාස 06ක් හෝ ඊට වැඩි/ පැය 720ක් හෝ ඊට වැඩි) - ලකුණු 02<br>VI. සහතික පත්‍ර (මාස 03ක් හෝ ඊට වැඩි/ පැය 360ක් හෝ ඊට වැඩි) - ලකුණු 01 | 05<br><br><br><br>15 | 40 |
| **2.3** හදාරා ඇති පාඨමාලා හා පුහුණු පාඨමාලා<br>I. ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ භාෂා ඩිප්ලෝමා සඳහා (මාස 06ක් හෝ ඊට වැඩි/ පැය 720ක් හෝ ඊට වැඩි) -ලකුණු 02<br>II. ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලා සඳහා (මාස 03ක් හෝ ඊට වැඩි/ පැය 360ක් හෝ ඊට වැඩි) -ලකුණු 01<br>III. පරිගණක ඩිප්ලෝමා සඳහා (මාස 06ක් හෝ ඊට වැඩි/ පැය 720ක් හෝ ඊට වැඩි) -ලකුණු 02<br>IV. පරිගණක සහතික පත්‍ර පාඨමාලා සඳහා (මාස 03ක් හෝ ඊට වැඩි/ පැය 360ක් හෝ ඊට වැඩි) -ලකුණු 01<br>V. බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කල පුහුණු වැඩ සටහනක් සඳහා (වර්තමාන තනතුරට පත් වූ පසු) (දින 03ක් හෝ ඊට වැඩි) -ලකුණු 01<br>**(ඉහත 2.2 හා 2.3 සඳහා එක් විෂය ක්ෂේත්‍රයක් සඳහා ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)** | 05 | |
| **2.4** වර්තමාන තනතුරට පත් වූ පසු සහභාගි වූ ක්‍රීඩා සඳහා<br>I. මව්රට නියෝජනය හෝ ජාතික සංචිතය නියෝජනයක් සඳහා -ලකුණු 05 (ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුමැතිය මත සහභාගි වී තිබිය යුතුය)<br>II. රාජ්‍ය සේවා ජයග්‍රහණයක් සඳහා - ලකුණු 04<br>III. පළාත් රාජ්‍ය සේවා ජයග්‍රහණයක් සඳහා - ලකුණු 03<br>IV. අන්තර් බන්ධනාගාර තරගාවලි ජයග්‍රහණක් සඳහා - ලකුණු 02<br>අන්තර් බන්ධනාගාර තරගාවලි සඳහා ආයතන නියෝජනයක් සඳහා (උපරිම ලකුණු 02) - ලකුණු ½<br>**(එක් ක්‍රීඩාවකට ලකුණු ලබන්නේ ඉහළම නියෝජනය වෙනුවෙන් පමණි)** | 05 | |

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.අ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

| | | |
|---|---|---|
| **2.5** වර්තමාන තනතුරට පත් වූ පසු **සමිති සමාගම් වල දැරූ තනතුරු**<br>උපරිම ලකුණු<br>I. දෙපාර්තමේන්තු මට්ටමේ සංගම් වල නිලතල දැරීම - ලකුණු 02<br>(සභාපති, උප සභාපති,ලේකම්,භාණ්ඩාගාරික) (වසරකට 01 ලකුණ බැගින්)<br>II. දෙපාර්තමේන්තු මට්ටමේ සංගම් වල වෙනත් තනතුරු දැරීම - ලකුණු 01<br>(වසරකට 01 ලකුණ බැගින්)<br>III. ආයතන මට්ටමේ සංගම් වල නිලතල දැරීම - ලකුණු 01<br>(සභාපති, උප සභාපති ,ලේකම්, භාණ්ඩාගාරික) (වසරකට 01 ලකුණ බැගින්)<br>IV. ආයතන මට්ටමේ සංගම් වල වෙනත් තනතුරු දැරීම - ලකුණු 01<br>(වසරකට ලකුණු ½ බැගින්) | 05 | |
| **2.6 සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව :**<br>I. නායකත්වය - ලකුණු 02<br>II. සන්නිවේදන හැකියාව - ලකුණු 02<br>III. පෞරුෂත්වය - ලකුණු 01 | 05 | |
| <u>මුළු ලකුණු</u> | | **100** |

සැ.යු :

I. ඉහත 2.1, 2.4 හා 2.5 සඳහා ලකුණු දෙනු ලබන්නේ වර්ථමාන තනතුරට පත් වූ පසු ලබා ගන්නා සහතික පත්‍ර වෙනුවෙන් පමණි.

II. ඉහත 2.2 හා 2.3 සඳහා එක් විෂය ක්ෂේත්‍රයක් සඳහා ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

III. ඉහත 2.3 කරුණේ I සහ II ක්ෂේත්‍ර සඳහා ලකුණු ලබා දීමේ දී බැදුණු මාධ්‍යයට අදාල පාඨමාලා සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.
(උදා:- ඔබගේ බැදුණු මාධ්‍ය සිංහල නම් සිංහල භාෂා පාඨමාලා සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ./ ඔබගේ බැදුණු මාධ්‍ය දෙමළ නම් දෙමළ භාෂා පාඨමාලා සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.